# ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය; පඤ්චතන්ත්‍රය; හා හිතෝපදේශය ඇසුරෙන් කෙරෙන විමසුමක්

## How Intense Avarice Affects Conflicts and Crises; an Inquiry Based on Pañcatantra and Hitopadeśa

කරඳගොල්ලේ සෝභිත හිමි

**Abstract**

Pañcatantra and Hitopadeśa are the great books of Sanskrit didactic literature. Especially these books have written with the aim of providing advice for governance. Various stories and incidents have been used to achieve that purpose. It is very important that the stories and events have been described using different animal characters and human characters. According to those stories, we can recognize that, due to the different behavior patterns of people, they face various conflicts and crises. There are many reasons for such conflicts and problems. Ignorance, Misbehavior, Avarice, Misunderstanding, Inappropriate speech, Intolerance of other opinions.

Accordingly, it is possible to identify how people face many conflicts and problems due to avarice. According to Pañcatantra and Hitopadeśa, avarice for power, avarice for possessions, avarice for various objects, etc. can be identified as ways by which people face conflicts and problems. Therefore, this study describes how people face conflicts and crises due to avarice with reference to the Pañcatantra and Hitopadeśa.

**Keywords:-** Pañcatantra, Hitopadeśa, averice, conflicts, crises

## හැඳින්වීම

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය මගින් රාජ්‍ය පාලනයට අදාළ නීති ශාස්ත්‍රය පිළිබඳ අවබෝධය ලබා දෙයි. විශේෂයෙන් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශයට ගැටුම් හා ප්‍රශ්න ඇතිවීම සඳහා බලපාන සාධක වශයෙන් අර්ථාන්විත පාලනයක් ගෙන යා හැකි දේශපාලන ව්‍යුහයක් නොමැති වීම හා පිළිගත හැකි දේශසීමාවන් නොතිබීම, ජනවාර්ගික සාධක, දේශපාලන සාධක, ආර්ථික හා සාමාජීය සාධක හා සංස්කෘතික සාධක යන කාරණාවන් හඳුනාගැනීමට හැකිවේ. එම සාධක මුල්කොට පුද්ගල සන්තානගතව හා සමාජයේ ජීවත්වන්නවුන් අතර ගැටුම් හා අර්බුද ප්‍රභවයෙහිලා මෙන්ම විනාශය පිණිස බලපාන සර්වකාලීන වූ හේතු රාශියක් විස්තර කරයි. පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ විස්තර කරන එම හේතු අතර නූගත්කම, තෘෂ්ණාව, වැරදි හැසිරීම, වැරදි වැටහීම, නුසුදුසු භාෂණය, අන්‍ය මත නො ඉවසීම ආදි හේතු දක්නට ලැබේ. එම හේතුන් කරණ කොටගෙන පුද්ගල සන්තානගතව ඇති වන විපර්යාසයෙන් ඔවුන් කායිකව හා මානසිකව වෙහෙසට, පසුතැවීමට හා කනස්සල්ලට පත්වන බවත් එයම සමාජ දේහය තුළ විවිධ ගැටුම් හා අර්බුද නිර්මාණය වීමට බලපාන බව හඳුනාගත හැකිවේ. මෙම පර්යේෂණය මගින් ගෙනහැර දැක්වීමට උත්සුක වනුයේ ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය පිළිබඳව ය.

## පර්යේෂණ ගැටලුව

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ අන්තර්ගත කථා හා සංසිද්ධීන් මගින් විස්තර කරන ආකාරයට ගැටුම් හා අර්බුද ඇති වීම සඳහා දැඩි තෘෂ්ණාව හේතු වී ඇත් ද ?

## පර්යේෂණ අරමුණු

පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයෙහි දැඩි තෘෂ්ණාව ගැටුම් හා අර්බුද ඇතිවීමට හේතුවන අකාරාය හඳුනාගැනීම

**පර්යේෂණයේ වැදගත්කම**

සංස්කෘත උපදේශ සාහිත්‍යාගත පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය පිළිබඳ සාහිත්‍යාත්මක වශයෙන් කරන ලද අධ්‍යයනයන් බොහෝමයක් දක්නට ඇත. එහිදි වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ එම ග්‍රන්ථයන්හි අන්තර්ගතය හා විවිධ සංස්කරණයන් පිළිබඳවය. විශේෂයෙන් රාජ්‍ය පාලනයට අදාළ නීති ශාස්ත්‍රය පිළිබඳ අවබෝධය ලබාදෙන එම ග්‍රන්ථයන්හි උපයුක්ත කථාන්දර හා සිද්ධීන් මගින් විස්තර කරන ගැටුම් හා අර්බුද ඇතිවීමට මූලික වන කරුණු පිළිබඳ කරන ලද අධ්‍යයන නොමැති තරම්ය. දැඩි තෘෂ්ණාව අර්බුද හා ගැටලු ඇතිවීම සඳහා බලපාන්නා වූ ප්‍රධාන හේතුවක් වශයෙන් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ විස්තර කෙරේ. ඒ අනුව ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා බලපානු ලබන හේතු පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත තොරතුරු අධ්‍යයනය කරනු ලබන විද්‍යාර්ථීන්ට මෙම විමර්ශනය මහත් පිටුබලයක් වේ.

**පර්යේෂණ සීමා**

මෙම පර්යේෂණයේදී ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය පිළිබඳ නිර්ණය කිරීමෙහිලා විෂ්ණුශර්මන් පඬිවරයාගේ පඤ්චතන්ත්‍රය හා නාරායණ ශර්මන් පඬිවරයාගේ හිතෝපදේශය යන ග්‍රන්ථ ද්වය පරිශීලනය කිරීමට අපේක්ෂා කරන අතර එම පුරාතන කෘතීන්හි අන්තර්ගත කථාන්දර හා සිද්ධීන් විමර්ශනයට භාජනය කෙරේ. එහිලා උක්ත කෘති සඳහා M.R.Kale මහතා විසින් සංස්කරණය කරන ලද මූලපාඨ ඇතුළත් ග්‍රන්ථ භාවිත කෙරේ.

**සාහිත්‍ය විමර්ශන**

පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයන් පිළිබඳ විමසා බැලීමේදී Franklin Edgerton මහතා විසින් රචනා කරන ලද 'The Panchatantra Reconstructed Vol. II' (1924) කෘතියෙහි පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගතය පිළිබඳවත්, ඒවායෙහි විවිධ සංස්කරණයන් පිළිබඳව දක්නට ලැබෙන විවිධ මතවාද පිළිබඳවත් ඉතා දීර්ඝ වශයෙන් විස්තර කර දක්වයි.

නමුත් එම කෘතීන්හි අන්තර්ගත ගැටුම් හා අර්බුද ඇතිවීමෙහිලා හේතු වන කාරණාවන් පිළිබඳ කරනු ලබන විස්තර කථනයන් දක්නට නොමැත.

A.B Keith මහතා විසින් රචනා කරන ලද ‘A History of Sankrit Literature’ (1928) කෘතියෙහි පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයෙහි කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කරමින් තොරතුරු ඉදිරිපත් කරන අතර මෙම පර්යේෂණය සඳහා ප්‍රස්තුතාගත මාතෘකාව පිළිබඳ කරුණු ගෙන හැර දැක්වීමක් සිදු නොවේ.

A.A. Macdonal මහතා සිය ‘A History of Sanskrit Literature’ (1899) නම් කෘතියෙහි ද ජී.එස්.බී. සේනානායක මහතා සිය ‘**සංස්කෘත සාහිත්‍යය**’ (1960) නම් කෘතියෙහි ද තත් කෘතීන්හි කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන අතර තත් කෘතීන්හි විස්තරන වන කථා හා සිද්ධීන් මගින් නිරූපණය වන ගැටුම් හා අර්බුද ඇතිවිමට බලපාන හේතු පිළබඳ කරුණු ඉදිරිපත් කිරීමක් නොකරයි.

මෙනයින් සලකා බලන කල පඤ්චතන්ත්‍රයෙහි හා හිතෝපදේශයෙහි අන්තර්ගත කථාන්දර හා සිද්ධීන් මගින් නිරූපිත ගැටුම් හා අර්බුද ඇතිවීමට බලපාන හේතු පිළිබඳ සිදුකරනු ලබන අධ්‍යයනයක් සිදුව නොමැති බව පැහැදිලි කළ හැකිය. එනිසාම ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපාන ආකාරය පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය තුළ අන්තර්ගත කථා හා සිද්ධීන් මගින් විශද වන ආකාරය පිළිබඳව ද ප්‍රාමාණික අධ්‍යයනයක් සිදුව නොමැත.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තේමා විශ්ලේෂණ හා සංධාර පර්යේෂණ ක්‍රමය මෙහිදී උපයුක්ත කරගනු ලැබේ. සංස්කෘත උපදේශ සාහිත්‍යයේ එන විෂ්ණුශර්මන්ගේ පඤ්චතන්ත්‍රය හා නාරායණශර්මන්ගේ හිතෝපදේශය යන කෘතීන් සඳහා ලියැවී ඇති අටුවා, පරිවර්තන හා වෙනත් විස්තරකථනයන් පරිශීලනය කෙරේ.

## උපන්‍යාසය

පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ ලක්ෂිත කථාවන්ට හා සිද්ධීන්ට අනුව ගැටුම් හා අර්බුද ඇතිවීම සඳහා දැඩි තෘෂ්ණාව බලපා ඇත.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

පුද්ගලයා ආධ්‍යාත්මික වශයෙන් හා සාමාජීය වශයෙන් ගැටුම් සඳහා යොමු කරවන ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගත හැකි කාරණයක් නම් දැඩි තෘෂ්ණාව යි. දැඩි තෘෂ්ණාව නිසා ශෝකය හා බිය හටගන්නා බවත් එයින් මිදුණු පුද්ගලයාට ශෝකයක් හෝ බියක් ඇති නොවේ යැයි බෞද්ධ දර්ශනයේ දී උගන්වයි.

තණ්හාය ජායතී සොකො- තණ්හාය ජායතී භයං- තණ්හාය විප්පමුත්තස්ස- නත්ථි සොකො කුතො භයං (ධම්මපද විවරණය, මොරගොල්ලේ සිරි ඤාණොභාස තිස්ස හිමි, 2007:441).

එලෙසම බුදුදහමේ ඉගැන්වෙන පරම නිෂ්ඨාව වූ නිවන් සාක්ෂාත් කරගැනීම 'තණ්හාව' ක්ෂය කිරීමෙන් හෙවත් නැති කිරීමෙන් ලබාගත හැකි බව උගන්වයි.

තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති' (ම.නි. මහාමාලුඞක්‍ය සුත්ත, 1956:170).

මෙම තණ්හාව නිසා මිනිසා මෙලොව පරලොව දැඩි වෙහෙසට දුකට පත්වන අකාරය බුදුදහමේ උගන්වා ඇත.

සංස්කෘත උපදේශ සාහිත්‍යයේ ද දැඩි තෘෂ්ණාව නිසා පුද්ගලයා ආධ්‍යාත්මික වශයෙන් හා සාමාජීය වශයෙන් වෙහෙසට දුකට පත්වන ආකාරයත් එනිසා ම විවිධ වූ ගැටුම්වලට මුහුණ පාන්නට සිදුවන ආකාරයත් විවිධ කථාන්දර උපයෝගී කොටගෙන උගන්වා ඇත. පුද්ගලයා මානසික වශයෙන් පසුතැවීමට හා කරදරයන්ට ලක් වී ජීවිතයෙන් පවා වන්දිගෙවීමට සිදුවන අවස්ථාවන්ට මුහුණ පෑමට දැඩි තෘෂ්ණාව හේතු වන ආකාරය සදුපදේශාත්මකව ගෙනහැර දක්වයි. තමන් කිසිසේත් බලාපොරොත්තු නොවන කරදරවලට හා හිරිහැරයන්ට දැඩි තෘෂ්ණාව මග පාදන බව උගන්වයි.

එමෙන්ම දැඩි තෘෂ්ණාව නිසා මිනිසුන් විරසකයට පත් කරමින් තම වාසිය සලකා ඇතැම් අය විසින් ගැටුම් නිර්මාණය කිරීමට ද හැකියාව පවතී. එමගින් සිදුවන්නේ කිසිදු වරදක් නොකළ, ඉතා සහෝදරත්වයෙන් සිටින දෙදෙනෙකු හෝ පිරිසක් වෙන්ව බෙදී ගොස් විරසකව කටයුතු කිරීම මෙන්ම එකිනෙකාට විරුද්ධව අවි අමෝරා යුද වැදීමයි. එහි අවසන් ප්‍රතිඵලය වන්නේ ඉතා බරපතල දේපළ හා ජීවිතහානි සිදුවීමයි. පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය යන ග්‍රන්ථ ද්වයෙහිම සුහෘද්භේද කාණ්ඩයේ ප්‍රධාන කථාව වශයෙන් පයීත පිංගලක හා සංජීවක දෙදෙනාගේ මිත්‍රත්වය කරටක හා දමනක නම් සිවලුන් දෙදෙනාගේ උපක්‍රම මගින් බිඳීයන අයුරු දක්වන කථාන්දරය මේ සඳහා මහාර්ඝ වූ නිදර්ශනයකි.

වනයෙහි සිංහ වෘෂභ දෙදෙනෙකුගේ වැඩෙන්නා වූ මහත් වූ සෙනෙහස කේලාම් කියන ඉතා ලොල් වූ සිවලෙකු විසින් නසන ලදි. (Kale, 1969:03, (Kale, 1967:32).

වර්ධමාන නම් වෙළෙන්දෙකුගේ සංජීවක නම් ගොනකු වෙළදාම පිණිස ගැලක යොදා යන විට අතරමගදී මඩෙහි එරෙයි. ඌව එයින් ගොඩගැනීමට උත්සාහ කළ ද එය ව්‍යර්ථ වෙයි. එනිසා ඌ අතහැර යන අතර සංජීවකයා ද කෙසේ හෝ මඩෙන් ගොඩවිත් රිසි සේ ළා තණ කොළ කමින් ගං ඉවුරක හැසිරෙන්නේ ඉතා පුෂ්ටිමත් අඟ පසඟ ඇත්තේ මහ හඬින් නාද කරයි. එම වනයෙහි සිටි පිංගලක නම් සිංහයා එම හඬ අසා බිය වී ජලය පවා නොබී ආරක්ෂාව තරකොට සිටියි. මෙය දකින ඇමති පුත්‍ර වූ සේවයෙන් පහකළ දමනක හා කරටක නම් සිවලුන් දෙදෙනා පිංගලක සමීපයට ගොස් කරුණු විමසා සංජීවක පිළිබඳ සොයා බලයි. ඒ අනුව සියලු කරුණු දැනගෙන පිංගලක හා සංජීවක දෙදෙනාගේ මිත්‍රත්වය ඇති කරයි. ඉන්පසු මේ දෙදෙනා දැඩි මිත්‍රත්වයෙන් ධාර්මික කථා සල්ලාපයෙන් කාලය ගතකරන්නට විය. මේ හේතුවෙන් කරටක හා දමනක දෙදෙනාට කරන ලද සැලකීම් ද අඩුවෙයි. සංජීවක සමඟ ඇති මිත්‍ර සන්ථවයෙන් කාලය ගත කිරීම හේතුවෙන් පිංගලක දඩයමේ යෑම ද නොතකා හරින ලදි. මෙය තමන්ගේ දිවි පැවැත්මට බරපතල තර්ජනයක් බව සිතන දමනක තමන්ට ලැබෙන ලාභය පිළිබඳ වූ දැඩි ලෝභයෙන් කේලාම් කියා පිංගලක හා සංජීවක දෙදෙනාගේ මිත්‍රත්වය බිඳ දමයි. එහි අවසානය කෙතෙක් ද යත් දෙදෙනා යුද වදින අතර පිංගලක අතින් සංජීවකයා මරණයට පත්වෙයි. (Kale, 1969:01-92).

උක්ත සිදුවීමෙහි සංජීවක හා පිංගලක දෙදෙනා අතර මිත්‍රත්වය ඇති කරන්නේත් බිඳ දමන්නේත් දැඩි තෘෂ්ණාව මුල්කොට කටයුතු කරන ලද සිවලෙකු විසින් ය. ඔහු තමන්ට ලැබෙන ලාභ ප්‍රයෝජන ආදිය අහිමි වූ විට ඒවා නැවත ලබාගැනීම සඳහා ලෝභී සිතින් කටයුතු කොට දෙදෙනෙකු අතර ගැටුමක් ඇති කරයි. එමෙන්ම පිංගලකයා ද තම බලයට ලෝභී වී සංජීවක තම රජකම පැහැර ගැනීමට සැරසෙන්නේ යැයි සිතා මෙම ගැටුමට මුල් වී තම මිත්‍රත්වය කෙලෙසා ගන්නා අතර සැබෑ මිතුරෙකු ද අහිමි කරගනී. ඒ බලයට, නිලයට, ප්‍රභූත්වයට ලෝභී සිතින් කටයුතු කරන්නට යාම නිසාවෙනි. එමෙන්ම මෙයින් පැහැදිලි වන අනෙක් කරුණ නම් ලෝභී භාවය පුද්ගල අභ්‍යන්තරයේ හටගෙන එය ගැටුමක් දක්වා වර්ධනය වී පුද්ගල ජීවිත අහිමි වන තත්වය දක්වා එය උඩු දුවන බවයි.

එමෙන්ම හිතෝපදේශයේ මිත්‍රලාභ කථා සංග්‍රහයේ සඳහන් රන් වළල්ලකට ලොල් වූ මගියා පිළිබඳ කථාව ද මෙයට කදිම නිදසුනකි. එම කථාව මෙසේ ය.

දක්ෂිණාරණ්‍යයෙහි එක් ව්‍යාඝ්‍රයෙක් විල් ඉවුරක කුස තණ ගත් අතැතිව සිට පින්වත්නි, මේ රන් වළල්ල ගනු මැනැවැයි ප්‍රකාශ කරයි. ලෝභී මගියෙක් මේ රන් වළල්ල දැක මෙය වාසනාවට ලැබෙන්නකි. නමුත් මේ ව්‍යාඝ්‍රයා කෙරෙහි මොන විශ්වාසයක් දැයි සිතා 'තා විශ්වාස කළ නොහැකැයි' මගියා ව්‍යාඝ්‍රයාට කීවේය. ව්‍යාඝ්‍රයා ද චාටු බස් කියමින් තමා කෙරෙහි බිය නොවිය යුතු බවත් කරදරයක් නොකරන බවත් පවසමින් රන් වළල්ල ගන්න යැයි මගියාට පැවසීය. එයින් රැවටුනු ලෝභී මගියා ව්‍යාඝ්‍රයා කී පරිදි ස්නානය කොට විලට පිවිසියේය. මඩෙහි එරුණු මගියා වෙත ව්‍යාඝ්‍රයා අවුත් ඔහු මරා කෑවේය. (Kale, 1967:06-07).

මෙම කථාවෙන් ද පැහැදිලි කරනු ලබන්නේ දැඩි තෘෂ්ණාව නිසා මිනිසුන්ගේ ජීවිත ද ඉතා අවාසනාවන්ත ආකාරයෙන් අහිමි වෙන බවයි. දැඩි තෘෂ්ණාවෙන් කටයුතු කරන්නට යෑම නිසා පුද්ගලයන් ගැටුම්වලට යොමු වන ආකාරය මෙන්ම එමගින් ජීවිත විනාශ වන ආකාරය ද පැහැදිලි කරනු ලැබේ. හිතෝපදේශයේ මිත්‍රලාභයේ එන තවත් කථාවක් මෙසේය.

චිත්‍රග්‍රීව නම් පරෙවියා සිය පිරිස සමග කෑම සොයා අහසේ පියාඹා යන විට, පරෙවියෝ කැලයේ විසිර පවතින සහල් කැබලි දැක ඒවා කෑමට උත්සුක වෙති. එම අවස්ථාවේ චිත්‍රග්‍රීව සඳහන් කරන්නේ 'මේ කැලයේ සහල් කැබලි තිබෙනවා යනු' කිසිවෙකු විසින් අටවන ලද උගුලක් විය හැකි බවයි. එහෙයින් එතැනට යෑමෙන් වැළකී සිටීම වඩා සුදුසු බවයි. නමුත් එයට ඇහුම්කන් නොදී ප්‍රතිවිරුද්ධ අදහස් දැරූ පරෙවියෙකුගේ අදහසට එකතුව ආහාරයේ ලොල් වී සියලුදෙනා සහල් කැබලි කෑමට එතැනට පිවිසෙති. එයින් සිදුවන්නේ වැද්දෙකු විසින් අටවා තිබූ දැලෙහි සියලු පරෙවියන් පැටලී දැඩි දුකට පීඩාවට පත්වීමයි. (Kale, 1967:01-08).

උක්ත කථාවේ සඳහන් පරෙවි රංචුව දැලෙහි පැටලෙන්නේ ද දැඩි තෘෂ්ණාව හේතුවෙන් නුසුදුසු තැනක තිබූ සහල් කැබලි කෑමට යාමෙනි. එයින් එම සියලුදෙනා දුකට හා පීඩාවට පත්වෙයි. මේ අනුව පුද්ගල සන්තානගත තෘෂ්ණාව දැඩි වී තර්ක විතර්ක කරගනිමින් ගැටුම් ඇති කරගැනීමේ තත්වයට වර්ධනය වන ආකාරයත් එයින් එක් අයෙකුට පමණක් නොව බොහෝ පිරිසකට දුකට පීඩාවට හා සන්තාපයන්ට මුහුණ දීමට සිදුවන බවත් පැහැදිලි වෙයි. එහෙයින් එකී කාරණයෙන් ද ගැටුම් ඇති වීමට තෘෂ්ණාව හේතුවන බව තේරුම් ගත හැකිවෙයි.

එමෙන්ම, හිතෝපදේශයේ මිත්‍රලාභයේ එන තවත් කථාවක් මෙසේය.

කල්‍යාණ කටකයේ භෛරව නම් වැද්දෙක් වින්ධ්‍යා වනයට ගොස් මුවෙකු මරා ගෙනෙන විට ඌරෙකු දැක ඌරාට සිය දුන්නෙන් විද්දේය. ඌරා හී පහර වැදී දරුණු ගෙරවීම් කරමින් වැද්දාගේ අණ්ඩකෝෂ ප්‍රදේශයට පහර දී මැරී වැටෙයි. ඌරාගේ එම පහරින් වැද්දා ද ජීවිතක්ෂයට පත්විය. මොවුන් දෙදෙනාගේ පා ගැටීමෙන් අසල සිටි සර්පයෙකු ද මරණයට පත්විය. දීර්ඝසරාව නම් සිවලෙක් ආහාර සොයා ඇවිදින්නේ මැරුණු මිනිසා, මුවා, ඌරා සහ සර්පයා දැක, 'අහෝ මට ලොකු ආහාරයක් ලැබුණි. මෙයින් මට මාස ගණනක් ජීවත් විය හැකි' යැයි කල්පනා කොට පළමුව රස නැති නහර වැලින් කළ දුනුවැල කමියි සිතා එය හපන විට දුන්න ගැස්සී පපුවේ ඇනී මරණයට පත්විය. (Kale, 1967:24-25).

උක්ත කථාවෙන් ද පැහැදිලි කරන්නෙ දැඩි තෘෂ්ණාව නිසා මිනිසුන් මරණයට පත්වන ආකාරය හා නිස්කාරණයේ තම ජීවිතය

අහිමි කරගන්නා ආකාරයයි. ලෝභයෙන් කටයුතු කරන්නට උත්සුක වන කවර අයෙකු වුව ද එයින් විපතට පත්වන ආකාරය මෙම කථාවෙන් පැහැදිලි වෙයි.

එමෙන්ම දැඩි තෘෂ්ණාව හා ආශාව හේතුකොට ගෙන මිනිසුන් කායික හා මානසික වශයෙන් පීඩාවට පත්වනවා පමණක් නොව තමන්ට ලැබෙමින් පැවති ලාභයෙන් ගිලිහී ජීවිතය පවා අහිමි කර ගන්නා තත්ත්වයට පත්වන බව පඤ්චතන්ත්‍රයේ කාකොලූකීය කාණ්ඩයේ අන්තර්ගත 05වන කථාවේ හරිදත්ත නම් ගොවියාගේ වෘත්තාන්තයෙන් පැහැදිලි වෙයි.

කිසියම් ප්‍රදේශයක හරිදත්ත නම් බමුණෙකු කෘෂිකර්මාන්තයේ යෙදුණ ද ඔහුගේ එම කටුයතු නිෂ්ඵල විය. ග්‍රීෂ්ම කලය අවසානයේ එක්තරා මධ්‍යාහ්නයක ගස් සෙවණක් යට නිදා සිටින ඔහුට කුඹුර සමීපයේ ඇති තුඹසකින් හිස එළියට දමා සිටින විශාල නාගයෙකු දක්නට ලැබුණි. නාගයා දැකීමෙන් 'මේ මෙම කුඹුරට අධිපති දෙවියා යග කිසිදිනක මා එම දෙවියන්ට පූජා නොපැවැත් වූ හෙයින් තම කටයුතු නිෂ්ඵල වී යැයි' සිතා කෙසේ හෝ කිරි ටිකක් සොයාගෙන භාජනයකට දමා තුඹස සමීපයේ තබා නිවසට ගියේය. පසුදින පැමිණ බලන විට එම භාජනයේ රන් කාසියක් විය. මෙලෙස දිනපතා නාගයාට කිරි තබා රන් කාසියක් ලබයි. දිනක් හරිදත්තට නගරයට යාමට සිදුවී එම කාර්යය තම පුතුට භාරදෙන ලදි. ඔහු ද එසේ කිරි දී පසුදින බලන විට රන් කාසිය දැක තුඹස විශාල රන් කාසි තොග යක් ඇත. එම රන් කාසි මේ නාගයා විසින් රකිනු ඇතැයි සිතා පසුදින කිරි බඳුනක් හා මුගුරක් රැගෙන ගොස් තුඹස සමීපයේ කිරි බඳුන තබා නාගයා පිටතට පැමිණෙන තුරු බලා සිටියේය. නාගයා පිටතට පැමිණි පසු ඌට මුගුරෙන් පහර දුන් අතර එම පහර කාගෙනම නාගයා ද බ්‍රාහ්මණ පුත්‍රයාට දෂ්ට කළේය. එයින් ඔහු මරණයට පත් විය. (Kale, 1969:157-158).

මෙම කථාවේ බ්‍රාහ්මණ පුත්‍රයාගේ මරණයට හේතු වූයේ කරුණු හරිහැටි නො දැන දැඩි තෘෂ්ණාව හා ආශාවෙන් කටයුතු කරන්නට වීම නිසාවෙනි. පුද්ගල අභ්‍යන්තරයෙහි ඇති වන්නා වූ මෙම ලෝභය නිසා එම පුද්ගලයා පමණක් නොව ඔහුට සම්බන්ධ සියලුදෙනාත් සමස්ත සමාජයත් දුකට කනගාටුවට ලක්වන ආකාරය දක්නට ලැබේ.

දැඩි තෘෂ්ණාව මිනිසුන් කායිකව හා මානසිකව දැඩි අපහසුතාවන්ට මෙන්ම කරදරයන්ට ලක්කරන බවට සාධක සපයන තව ද කථාවක් හිතෝපදේශයේ සුහෘද්ලාභයේ අන්තර්ගත වන්නේ මෙසේයි.

බ්‍රහ්මාරණ්‍යයෙහි කර්පූර තිලක නම් ඇතෙක් වාසය කළ අතර එහිම සිටි සිවල්ලු මෙම ඇතා මැරුණහොත් ඌගේ මස් තමන්ට මාස ගණනාවකට සෑහෙන බව ප්‍රකාශ කළහ. මෙය දැනගත් එක් මහලු සිවලෙක් මාගේ උපායෙන් ඔහු මරණයට පත් කරන්නෙමියි, ප්‍රකාශ කොට එම ඇතා වෙත ගොස් අටඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි, මේ වනයෙහි සිවුපාවුන් විසින් ඔබවහන්සේ රජකමට පත්කරගන්නා ලදි. අභිෂේකයට සුදුසු වේලාව පැමිණ ඇත. එහෙයින් ඉක්මනින් වැඩමවන සේක්වායි.' ආරාධනා කොට ආපසු ගියේය. රාජ්‍ය ලෝභයෙන් මැඩුණු සිත් ඇති ඇතා සිවලා පසුපස දුවන්නේ මඩෙහි එරුණේය. සිවලාගෙන් දැන් කුමක් කළ යුතු දැයි ඇතා විමසූ විට මාගේ වලිගයෙන් අල්ලා ගොඩට එන්න යැයි සරදම් කරයි. මරණයට පත් ඇතා සිවලුන් විසින් කන ලදි. (Kale, 1967:29-30).

මෙම කථාවේ සඳහන් ඇතා මරණයට පත්වන්නේ දැඩි ලෝභය නිසා ය. එපමණක් නොව එම දැඩි තෘෂ්ණාව නිසාම ඔහු මහලු සිවලාගේ සරදමට ද ලක්වෙයි. මෙයින් ද පැහැදිලි වන්නේ දැඩි ලෝභය පුද්ගලයා දුකට අපහසුතාවට පත්කර තම ජීවිතය ද අහිමි වන තත්වයට පත්කරන බවයි.

එමෙන්ම දැඩි තෘෂ්ණාව නිසා පුද්ගලයන්ට විවිධ ආකාරයේ කායික හා මානසික ගැටුම්වලට මුහුණදීමට සිදුවන බව ප්‍රකාශ කෙරෙන කථා අතර තුංගබල නම් රාජකුමාරයා, වෙළෙන්දා සහ ඔහුගේ බිරිය පිළිබඳ කථාව රසවත් ය.

කන්‍යාකුබ්ජයෙහි වීරසේන නම් රජ වීරපුර නගරයෙහි ධනවත් වූ තුංගබල නම් කුමාරයෙක් යුවරජ තනතුරට පත් කළේය. මොහු දිනක් නුවර හැසිරෙන විට ලාවණ්‍යවතී නම් රූමත් වෙළඳ බිරිඳක් දැක සිත් ඇති කරගත්තේය. ලාවණ්‍යවතී ද ඔහුට ආසක්ත වූ නමුත් 'මම පතිව්‍රතාවක්මි. පරපුරුෂ ස්පර්ශයකුදු නො ඉවසමි. මගේ ස්වාමියා යමක් අණවා නම් එය කී සැටියෙන්ම කරමියි.' කීවාය. තුංගබලට ඒ සියලු පුවත් කී විට එයට උපායක් යෙදීමට කුට්ටනියට පැවසීය. ඒ අනුව ඇයගේ උපදෙස් මත චාරුදත්ත නම් වෙළඳ පුත්‍රයා රාජ සේවකයෙකු කොට ඔහු විශ්වාස කටයුතුවල යෙදවීය.

ඒ අනුව තුංගබල සියලු ආභරණයන්ගෙන් සැරසී අද පටන් මා ගෞරීව්‍රතය එක් මසක් පිරිය යුතු යැයි කියා දිනපතා බාල යොවුන් එක අඟනක් ගෙනත් දිය යුතු යැයි අණ කළේය. ඔබ ගෙන එන ඇය මවිසින් පූජා සත්කාරයෙන් ගෞරව ලබන්නීය. චාරුදත්ත එසේ යොවුන් තරුණියන් ලැබීමට සලස්වා රහසිගතව යුවරජුගේ ක්‍රියාව දෙස බලාසිටියේය. යුවරජ ඔවුන්ට දුරසිට වස්ත්‍රාභරණ දී පූජා කොට ආරක්ෂාව සලස්වා යවයි. වෙළඳ පුත්‍රයා එයින් ලැබූ විශ්වාස ඇත්තේ ධනයට ලෝභයෙන් තම බිරිය වූ ලාවණ්‍යවතිය ද රජුවෙත යැවීය. රජු ද ඇය වැළඳගෙන සතුටු සිතින් ඇය සමඟ සයනය කරනු දැක මුළා වූ චාරුදත්ත අතිශයින් කලකිරීමට පත්වීය. (Kale, 1967:28-30).

මෙම කථා පුවතින් හෙළිවන්නේ ද දැඩි තෘෂ්ණාව පුද්ගලයාගේ මානසික අසහනයට කලකිරීමට හේතු වන ආකාරයයි. උක්ත කථාවේ චාරුදත්ත නම් වෙළඳ පුත්‍රයාට අපහසුතාවට කලකිරීමට පත්වීමට සිදුවූයේ තමාගේ දැඩි තෘෂ්ණාව හේතුවෙන් රජුගේ ධනය ලබාග ැනීමට උත්සාහ කිරීම නිසාවෙනි. තමන් ම තම බිරිඳ අයථා හැසිරීමකට යොමු කරවීම හේතුවෙන් ඔහු දැඩි කම්පනයට කලකිරීමට පත්වෙයි.

පඤ්චතන්ත්‍රයේ සුහෘද්භේද කථා සංග්‍රහයේ සඳහන් දැඩි ලෝලත්වය නිසා විනාශයට පත්වන ආකාරය දක්වන තවත් කථාවක් මෙසේය.

කිසියම් වන ප්‍රදේශයක නොයෙක් මසුන්ගෙන් පිරිපුන් විලක් සමීපයෙහි වයසට පත් කොකෙක් බඩසයින් පීඩිතව හඬන්නට විය. මෙය දුටු එහි සිටි කකුළුවෙක් කුමක් නිසා ආහාර නොගෙන මෙලෙස හඬමින් සිටින්නේදැයි විමසයි. එවිට කොකා පවසන්නේ දොළොස් වර්ෂයකින් වැසි නොලැබෙන බව දෛවඥයෙකු මගින් දැනගත් බවත් එහෙයින් මේ විලෙහි සිටින සියලු මසුන්ගේ විනාශය පිළිබඳ සිතෙන විට එය ඉවසනු නොහැකිව හඬන බවයි. මෙය දැනගත් විලෙහි සිටින මසුන් මේ සඳහා කළ යුතු සුදුසු උපාය ඔබම පවසන්න යැයි කොකාට දන්වයි. එවිට කොකා, 'වසර විසිහතරකින්වත් ජලය නොසිඳෙන විලක් මේ සමීපයෙහි ඇත. මගේ පිටට නැඟුණු අය එම විලට ගෙන ගොස් දමන්නෙමියි.' කීය. එයින් රැවටුණු මත්ස්‍යයෝ සතුටු වී විවිධ නෑකම් කියා ඔහු අමතමින්, තමන් පළමුව එහි ගෙන යන ලෙස ආයාචනා කළහ. ඉනික්බිති කොකා සිය තුඩෙන් එක් එක් මත්ස්‍යයා රැගෙන විල අසල ගල්තලාවකට ගොස් කා දමයි. මෙසේ ටික දිනක් යන විට ජීවිතාශාවෙන් සිටි කකුළුවා ද තමනුත් එම විලට රැගෙන

යන ලෙස කොකාගෙන් ඉල්ලීය. දින ගණනාවක් මත්ස්‍යයන් ආහාරයට ගෙන සිටි හෙයින් කකුළු මස් කෑමේ ලොල් වූ කොකා ද එය තමන්ට ලැබුණු කදිම අවස්ථාවක් ලෙස සලකා ඉතා ඕනෑකමින් ඔහු රැගෙන යාමට ඉදිරිපත් විය. කකුළුවා ද රැගෙන තම පුරුදු ගල් තලාවට යන කොකා තමන් කෑ මසුන්ගේ ඇටකටු බලන ලෙසත්, ඔබටත් අත්වන්නේ එම ඉරණම බවත් වහසි බස් දොඩයි. මෙයින් බියටත් කලකිරීමටත් පත්වන කකුළුවා කොකාගේ සාපරාධී ක්‍රියාවට දඬුවම් කළ යුතු යැයි කල්පනා කොට තම අඬුවලින් කොකාගේ ගෙල සිඳ බිමට පනී. ඉන්පසු සිය විලට ගොස් එහි සිටි අනිකුත් මත්ස්‍යයන්ට සියලු පුවත් පවසයි. (मित्रभेदम्, Kale, 1969:44-46).

අධික ආශාවෙන් මඩනා ලද සිතැත්තාට තමා කළ යුතු නොකළ යුතු දෑ කුමක්දැයි වටහා ගැනීම අසීරු වෙයි. එමෙන්ම තම ග්‍රහණයට ගැනීමට උත්සුක වන අයගේ හැකියාවන් තත්වයන් හා බල පරාක්‍රමය පිළිබඳවද අමතක කොට සිය වාසිය උදෙසා ආශාවෙන් දැඩි තෘෂ්ණාවෙන් අපරීක්ෂාකාරීව ක්‍රියාත්මක වෙයි. උක්ත කථාවේ සඳහන් කොකාට තම ජීවිතය අහිමි වන්නේ දැඩි ලෝභය හා ආශාව නිසා කකුළුවාගේ සාමාර්ථ්‍යය පිළිබඳ අනවබෝධයෙන් ඔහු තම ආහාරය වශයෙන් ගැනීමට උත්සාහ කිරීම නිසයි. ඒ අනුව පුද්ගල සන්තානගත දැඩි තෘෂ්ණාව එම පුද්ගලයාගේ විනාශය දක්වා හේතු වන ආකාරය පැහැදිලි වෙයි.

පඤ්චතන්ත්‍රයේ අපරීක්ෂිතකාරක නම් අවසන් කාණ්ඩයේ ද දැඩි තෘෂ්ණාව නිසා අපරීක්ෂාකාරීව ක්‍රියා කිරීම හේතුවෙන් විවිධ ගැටලු සහ කරදරවලට මෙන්ම විශාල අලාභයන් විඳීමට සිදුවන බව ප්‍රකාශ කරන කථා රාශියකි. එහි අන්තර්ගත එක් කථාවක් මෙසේය.

දකුණු දිග ජනපදයෙක්හි පාටලීපුත්‍ර නම් නගරයක් ඇත. ධර්ම, අර්ථ හා කාම යන සම්පත් අත්කර දීමේ උපායන්හි යෙදී දෛවානුකූලව නැසීගිය සම්පත් ඇති නිර්ධන භාවයට පත් මණිභද්‍ර නම් සිටුවරයෙක් එහි වාසය කළේය. එතැන් පටන් ඔහුට සිය ඥාති හිතමිත්‍රාදීන්ගේ අනාදරයත් අවමානයත් අවඥාවත් හැර සම්මානයක් නො ලැබිණි. මෙයින් අතිශය කලකිරීමට පත් ඔහු දිනක් නිර්ධන භාවයේ ඇති ආදීනව කල්පනා කොට උපවාසයක යෙදී නිරාහාරව සිට සිය දිවි නසා ගැනීමට ඉටාගෙන නින්දට ගියේය. නිදාගත් ඔහුට සිහිනෙන් එක්තරා ජෛන පූජකයෙකු පෙනී සිට 'තමන් තාගේ පූර්ව පුරුෂයන් විසින් රැස් කළ පද්මනිධි නම් නිධානය බවත් හෙට උදෑසන මේ වෙසින්ම නුඹගේ ගෙදරට පැමිණෙන බවත් එවිට

මුගුරකින් තම හිසට පහර දිය යුතු බවත් එසේ කළ විට කිසි කලකත් ක්ෂයවීමට පත් නොවන රන් කඳක් බවට තමන් පත් වන්නේ යැයි' පවසා අතුරුදහන් විය. පසුදින උදෑසන සිහිනෙන් දුටු දෙය විශ්වාස නොකළ හැකි යැයි මණිභද්‍ර සිතමින් සිටින විට සිය බිරිඳගේ කාර්යයක් සඳහා කරණවෑමියෙක් පැමිණ එම කටයුතුවල නිරතවන්නට විය. මේ වෙලෙහිම සිහිනෙන් පෙනී සිටි ජෛන පූජකයා මණිභද්‍රගේ නිවසට පැමිණි අතර ඔහු සිහිනෙන් කී පරිදිම මුගුරකින් එම පූජකයාගේ හිසට පහර දුන්නේය. එවිටම එය රන් කඳක් බවට පත්විය. මණිභද්‍ර එම රන් කඳ ආරක්ෂා සහිතව තබා රන් කහවනු කිහිපයකුත් අලුත් පිළි සඟලකුත් කරණවෑමියාට පරිත්‍යාග කොට 'මේ සියල්ල තබා ගන්නා ලෙසත් දුටු දෑ කිසිවෙකුටත් නොපවසන ලෙසටත්' සපථ කොටගෙන ඔහු පිටත් කරවීය.

මණිභද්‍රගේ නිවසේ සිදුවූ සිද්ධියෙහි සැබෑ තත්ත්වය නොදත් කරණවෑමියා නග්න පූජකයන්ගේ හිසෙහි මුගුරු ප්‍රහාර එල්ල කළ විට ඒ සියලුදෙනා රන් බවට පත්වන්නේ යැයි කල්පනා කොට පසුදින උදෑසන නා පිරිසිදු වී සමීපයෙහි පිහිටි ජෛන ආරාමයකට ගොස් එහි සිටි ප්‍රධාන පූජකයාගේ ගුණ වර්ණනා කොට සිය නිවසේ දහවල දානයට පැමිණෙන ලෙස ආරාධනා කරයි. නමුත් ඔහු 'තමන් කිසිවිටක දන් පිණිස කිසිවෙකුගේ නිවසකට නොයන බවත් ඉර මුදුන් වීමට ප්‍රථම ලැබෙන දෙයක් පමණක් අනුභව කරන බවත් පවසමින්' එම ආරාධනාව ප්‍රතික්ෂේප කරයි. එවිට 'තම නිවසේ බොහෝ ආහාරපාන රැස් කර ඇති බවත් පොත් ලිවීම සඳහා අවශ්‍ය රෙදි කඩත් ලේඛකයන් සඳහා ගෙවීමට මුදලුත් ඇති බව පවසමින් සුදුසු දෙයක් කරන ලෙස ඉල්ලා සිටිමින්' කරණවෑමියා සිය නිවසට ගොස්, ධනයට ලෝභයෙන් පූජකයන් නිසැකවම සිය නිවසට එන බව දැන මුගුරත් ගෙන ගෙයි දොරකඩ සැඟවී සිටියි. ධනයට ලෝභීව ප්‍රධාන පූජකයා ඇතුළු පූජකයන් කරණවෑමියාගේ නිවසට පැමිණි අතර කරණවෑමියා ඒ සියලුදෙනාට මුගුරෙන් හිසෙහි ප්‍රහාර එල්ල කළේය. එයින් ඇතමෙක් මරණයට පත්වන අතර දිවි බේරාගත් අය රාජපුරුෂයන්ට විස්තර කී හෙයින් කරණවෑමියාව අල්ලා අධිකරණයට ඉදිරිපත් කරන ලදි. එහිදී සිදුවූ දෑ ඇසූ විට තමන් මණිභද්‍රගේ නිවසේ දී දුටු සියල්ල අධිකරණ නායකයාට පවසන ලදි. මණිභද්‍ර ගෙන්වා කරුණු විමසූ විට ඔහු සියලු කාරණා පැහැදිලි කළ අතර එය ඇසූ අධිකරණ නායකයා විසින් කරණවෑමියාට මරණ දඬුවම නියම කරන ලදි. (Kale, 1969:228-231).

උක්ත කථාවේ කරණවෑමියා ජෛන පූජකයන් ගෙන්වා මරණයට පත් කරනු ලබන්නේ කරුණු හරිහැටි අවබෝධ නොකොට

දැඩි තෘෂ්ණාව කටයුතු කළ නිසාවෙනි. දැඩි තෘෂ්ණාවෙන් මඬනා ලද සිතැත්තාට යථාර්ථය ග්‍රහණය කරගැනීමට නොහැකි වේ. එයින් ඔහු විවිධ ගැටලුවලට ලක්වෙයි. එමෙන්ම සසර දුක නැති කිරීමට උත්සුක වන ශ්‍රමණයන්ගේ සිතෙහි ද දැඩි තෘෂ්ණාව නිරායාසයෙන් ප්‍රාදුර්භූත වන බව, ජෛන පූජකයන් පළමුව කරණවෑමියාගේ ආරාධනාව ප්‍රතික්ෂේප කොට දෙවනුව ඔහුගේ නිවසේ රැස්කර ඇති ද්‍රව්‍ය හා ධනය පිළිබඳ ලෝභී වී එහි දානය පිළිගැනීමට පැමිණීමෙන් පැහැදිලි වෙයි. එනිසාම ඇතැම් කෙනෙක් මරණයට පත්වෙති. ඇතමෙක් දරුණු ලෙස තුවාල ලබති. කරන ලද දරුණු අපරාධය නිසා කරණවෑමියාට මරණ දඬුවම හිමිවෙයි. දැඩි තෘෂ්ණාව මිනිසුන් කායික හා මානසික වශයෙන් පීඩාවට පත්කරන ආකාරය එයින් මොනවට ස්ඵුට වෙයි.

එමෙන්ම අපරීක්ෂිතකාරකයේ සඳහන් සුවර්ණසිද්ධි චක්‍රධර කථා වස්තුව ද දැඩි තෘෂ්ණාව හේතුවෙන් මිනිසුන් විවිධ ගැටලුවලට ලක්වන ආකාරය විස්තර කරයි. ඒ කථාව මෙසේය.

එක්තරා නගරයක ඔවුනොවුන්ට ඉතා හිතවත් වූ මිතුරෝ සිව්දෙනෙක් වූහ. දිළිඳු බවින් පෙළුණු ඔවූහු එක් වී සාකච්ඡා කොට නිර්ධනව සිටීම නින්දාවට හේතුවක් බැවින් ධනය සොයා විදේශයන්හි ඇවිදීමට තීරණය කළහ. මෙසේ ගම් නියම්ගම් පසු කරන ඔවූහු අවන්ති නගරයට පැමිණ සිප්‍රා නදියෙහි ජලස්නානය කොට ශිවලිංගයට නමස්කාර කොට නැවත පිටත් වූහ. එසේ යන අතරමග භෛරවානන්ද නම් යෝගියෙකු මුණ ගැසෙයි. යෝගියාට නිසි ගෞරව දක්වා සියලු තොරතුරු කී පසු එම යෝගියා මිත්‍රයන් සිව්දෙනාට යන්ත්‍ර සතරක් ලබා දී 'මේවා රැගෙන ඉදිරියට යන ලෙසත් එසේ යනවිට යම්තැනක යන්ත්‍රය වැටෙයි ද එතැන සාරා එහි ඇති ධනය ගන්නා ලෙසත්' පවසයි. ඔවූහු එය පිළිගෙන ඉදිරියට යාමට පිටත් වූහ. එසේ ගමන් කරන විට පළමු තැනැත්තාගේ යන්ත්‍රය බිම වැටුණි. පොළව හාරා බලන විට විශාල තඹ නිධානයක් මතුවිය. එය රැගෙන ආපසු යමු යැයි පළමු තැනැත්තා ප්‍රකාශ කළ ද දෙවන, තෙවන හා සිව්වන මිතුරෝ එයට එකඟ නොවූහ. පළමු මිත්‍රයා ඇති තාක් තඹ ගෙන සිය රට යාමට පිටත් වූ අතර සෙසු අය ඉදිරියට ගමන් කළහ. ටික දුරක් යන විට දෙවන තැනැත්තාගේ යන්ත්‍රය බිම වැටුණු අතර එතැන හාරා බැලූ කල රිදී නිධානයක් දක්නට ලැබිණි. එය රැගෙන ආපසු යමු යැයි දෙවන තැනැත්තා ප්‍රකාශ කළ ද තෙවන හා සිව්වන මිතුරෝ එයට එකඟ නොවූහ. දෙවන මිත්‍රයා ඇති තාක් රිදී ගෙන සිය රට යාමට පිටත් වූ අතර තෙවන හා සිව්වන තැනැත්තෝ ඉදිරියට ගමන් කළහ. මෙසේ ඉදිරියට

ගමන් කරන තෙවන පුද්ගලයගේ යන්ත්‍රය ද බිම වැටුණි. එතැන හාරා බලන විට විශාල රන් නිධානයක් මතුවිය. එයින් ඇතිතාක් රන් රැගෙන ආපසු යමු යැයි සිව්වන මිතුරාට ප්‍රකාශ කරන විට ඔහු 'පළමුව තඹ ද දෙවනුව රිදී ද තෙවනුව රන් ද ලැබුණු හෙයින් මීළඟට ඉතා වටිනා මැණික් ලැබේ යයි' පවසා තෙවන මිතුරාට ගමට යන්නට කියා ඉදිරියට ගමන් කරයි. තෙවන මිතුරා ද ඇතිතාක් රන් ගෙන තම ගමට පිටත්වෙයි.

ඉනික්බිති තනිවම වනයේ ඇවිදින සිව්වන මිතුරා සා පිපාසාවෙන් පෙළෙන්නේ එක්තරා දේවතාධිගෘහිත මහ වනයකට ඇතුල් විය. එහිදි ඔහුට දක්නට ලැබෙන්නේ අයෝමය වේදිකාවක් මත වැටී සිටින සියොලඟ ලේ තැවරුණු හිසෙහි කැරකෙන චක්‍රයකින් හිස කැපි කැපී සිටින පුද්ගලයෙකුගේ බියකරු දර්ශනයකි. එවිට 'ඔබ කවරෙක් ද? මේ කැලයේ කුමක් කරන්නේ ද? ඔබේ හිස මත කැරකෙන චක්‍රය කුමක් ද? අධික ලෙස පිපාස ඇත්තෙමි. අසලක දිය පහසුවක් ඇත්තේ දැයි' විමසීය. එම පුද්ගලයා හිස ඔසවා ඔහු දෙස බලනවාත් සමඟ එම චක්‍රය සිව්වන මිත්‍රයාගේ හිසට පැමිණ හිස කැපෙමින් ලේ ගලන්නටත් වේදනා ඇතිවන්නටත් විය. යහලුව, අහෝ මේ කිම් දැයි' චක්‍රයෙන් කැපී ගලායන ලේ සහිතව විමසීය. 'එය එක්තරා චාරිත්‍ර ධර්මයකි. මා ද එක්දිනක් චක්‍රධරව සිටි පුරුෂයෙකුගෙන් ඒ පිළිබඳ තොරතුරු විමසා දිය පහසුව ඇති තැනක් ඇසූ කල්හි එය තම හිස මතට පැමිණි බව ආගන්තුකයා පැවසීය.' එයින් මිදෙන්නේ කවදා දැයි ඇසූ විට, 'කිසියම් කලෙක අතෘප්තිකර ධන ලෝභයෙන් මඩනා ලද සිත් ඇතිව රුවන් සොයා ඇවිදින මං මුළා වූ අයෙකු මේ දෙවතාධිග ෘහිත ප්‍රදේශයට පැමිණ මාගෙන් විමසූ ප්‍රශ්න ඔබගෙන් විමසූ කල්හි චක්‍රය ඔබගේ හිසින් ඉවත්ව ඔහුගේ හිසේ රැඳෙනවා යැයි' ආගන්තුකයා පැවසීය. එමෙන්ම ඒ සඳහා දීර්ඝ කාලයක් යන බවත් කුවේරයා විසින් ධනලෝභී සිද්ධයන්ගෙන් තම ධනය ආරක්‍ෂා කර ගැනීමට කළ උපක්‍රමයක් නිසා මෙහි පැමිණෙන කවරෙකුට වුව ද මේ දණ්ඩනයට යටත් වන්නට සිදුවන බවත් එම දණ්ඩනයට යටත් වන පුද්ගලයාට සා පිපාසයක් නැත. නිදිමතක් නැත. ජරාමරණයක් නැත. ඇත්තේ මේ වේදනාව විඳ දරා ගැනීම පමණක් බවත් පවසා ඔහුට ස්තුති කොට ආගන්තුකයා පිටත්විය. රන් නිධානය ලැබ පිටත් වූ තෙවන මිතුරා, සිව්වන මිතුරා නොපැමිණි හෙයින් ඔහු සොයා ගොස් සිදු වූ විපත දැන අධික ලෝභයෙන් ක්‍රියා කිරීමට ගොස් සිදු වූ විපත බලවයි නින්දා කරන්නටත් මිතුරා පිළිබඳ ශෝක වන්නටත් විය. (Kale, 1969:232-236).

උක්ත කථාවේ බමුණු පුත්‍රයා ඉතා අවාසනාවන්ත ඉරණමකට ලක්වන්නේ ඔහු තුළ ජනිත වූ අධික ආශාව හා ලෝභී සිතුවිල්ල නිසයි.

එමෙන්ම එම බ්‍රාහ්මණ පුත්‍රයාට පෙර චක්‍රධාරීව සිටි ආගන්තුකයා ද එම තත්වයට පත්වූයේ තම සිත තුළ ඇති වූ දැඩි තෘෂ්ණාව නිසයි.

## සමාලෝචනය

රාජ්‍ය පාලනය පිළිබඳ උපදෙස් ලබාදීමේ අරමුණ ඇතිව රචනා කරන ලද පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ අන්තර්ගත කථාන්දර හා සිද්ධීන් මගින් සමාජයේ ජීවත් වන පුද්ගලයන් දැඩි තෘෂ්ණාවෙන් කටයුතු කිරීමට උත්සුකවීම හේතුකොට ගෙන විවිධ වූ ගැටුම් හා අර්බුදයන්ට මුහුණදීමට සිදුවන බව උක්ත පඤ්චතන්ත්‍ර හා හිතෝපදේශාගත කථාන්දර මගින් පැහැදිලි වෙයි. එහිලා විශේෂයෙන් හඳුනාගත හැකි කාරණයක් නම් සමාජයේ ජීවත් වන විවිධ තරාතිරම්වලට අයත් පුද්ගලයන් තෘෂ්ණාව හේතුකොටගෙන තම තත්ත්වයට නොගැළපෙන කටයුතුවල නියැලීමට උත්සුක වන ආකාරයත් එනිසාම විවිධ ගැටුම් හා අර්බුදයන්ට ලක්වන ආකාරයත් ය. ඒ අනුව පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ මගපෙන්වීම වනුයේ තෘෂ්ණාව මුල්කොට ගෙන සිදුකරනු ලබන චර්යාවන් එම පුද්ගලයාගේ අයහපත පිණිස අවැඩ පිණිස දුක පිණිස හේතු වන බවත් එයින් විනිර්මුක්තව කටයුතු කිරීම දියුණුව පිණිස යහපත පිණිස සුවය පිණිස උපස්ථම්භක වන බවත්ය.

## මූලාශ්‍රය

ධම්මපද විවරණය, (සංස්.), (2007), මොරගොල්ලේ සිරි ඤාණෝභාස තිස්ස හිමි, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

පඤ්චතන්ත්‍රය, (ශ්‍රී සුමංගල අභිනව ව්‍යාඛ්‍යාව, මිත්‍රභේද කථා සංග්‍රහය), (1990) (පරි.) පහමුණේ ශ්‍රී සුමංගල හිමි, කොළඹ: සමයවර්ධන.

පඤ්චතන්ත්‍රයේ කාකෝලූකීය, (2011), (පරි.), මිනුවන්ගමුවේ මහානාම හිමි, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්චතන්ත්‍රය, (2002), (පරි.), හේමපාල මුණිදාස, කොළඹ: ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

මජ්ඣිමනිකාය, (1956), බු.ජ.මු.

හිතෝපදේශය, (පරි.), හල්දොල විමලකිත්ති හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

Kale, M.R. (ed.), (1967), Hitopadeśa of Nārāyaṇa, Bombay: Gopal Narayana & Co.

Kale, M.R. (ed.), (1969), Pañcatantra of Viṣṇuśarman, Delhi: Motilal Banarsidass.